**13.** **ශීර්ෂය 13 - ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

**13.1** **විගණන විෂය පථය**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 28 දින කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**13.2** **ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරිම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**13.3** **විගණන නිරීක්ෂණය**

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) ඡේදයේ වූ පොදු නිරීක්ෂණය සහ පහත 13.4 සිට 13.8 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය.**

**-----------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 02 ක් සඳහා සළසා තිබුණු එකතුව රු.6,600,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් 05 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 සිට සියයට 98 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**13.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**-----------------------------------------------**

**13.4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

**-------------------------------------**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව 2013 වර්ෂය සඳහා වූ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**13.4.2 අභ්‍යන්තර විගණනය**

**---------------------------**

අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර තිබුණද සහය කාර්ය මණ්ඩලයක් පත් කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

**13.5 වත්කම් කළමනාකරණය**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**-----------------------------------------------**

වත්කම් සම්බන්ධයෙන් කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) එක්සත් ජාතීන්ගේ ව්‍යාපෘතියක් මඟින් ලබා දී තිබූ ධාවනයෙන් ඉවත්කරන ලද යතුරු පැදි 07 ක් හා වෑන් රථයක් අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ii) 2013 ජූනි 07, දෙසැම්බර් 26 හා 31 යන දිනයන්හීදී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනක් මගින් රු.1,662,550 ක් වටිනා පරිගණක හා කාර්යාල උපකරණ තොගයක් කොමිසමේ ප්‍රධාන කාර්යාලය වෙත භාර දී තිබූ අතර එම තොගයෙන් ප්‍රාදේශීය කාර්යාලවලට ලබා දීම සඳහා වෙන්කර තිබුණු භාණ්ඩ 2014 ඔක්තෝබර් 31 දින වන විටත් එම කාර්යාලවලට භාරනොදී නිෂ්ක්‍රියව පැවතුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම.**

---

2010 දෙසැම්බර් 17 දිනැති අංක PF/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර 2014 මාර්තු 31 දිනට ප්‍රථම එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, කොමිෂන් සභාව 2014 මැයි 31 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර තිබුණේ 2012 වර්ෂය වෙනුවෙනි.

**(ඇ) ලේඛනගත නොකළ වත්කම්**

---

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ මානව හිමිකම් සම්බන්ධ ව්‍යාපෘතියක් මගින් කොමිෂන් සභාවේ ප්‍රාදේශීය කාර්යාලවලට සෘජුවම ලබා දී තිබූ වත්කම් පිළිබඳ තොරතුරු කොමිෂන් සභාවේ ප්‍රධාන ඉන්වෙන්ට්‍රියේ ඇතුළත් කර නොතිබුණි.

**(ඈ) වත්කම් වෙනත් පාර්ශවයන්ට ලබාදීම**

---

ව්‍යාපෘතියකින් කොමිෂන් සභාව වෙත ලැබී තිබූ ලැප්ටොප් පරිගණක 2 ක් මානව හිමිකම් ව්‍යාපෘතියේ නිලධාරීන් දෙදෙනෙකුට නිකුත් කර තිබුණි.

**13.6 අනුකූල නොවීම්**

---

**නීති,රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

---

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහකර පහත දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
| --- | --- | --- |
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන** | **රු.** | |
| 1983 අංක 12 දරන | 118,012 | සේවකයකු ඉවත්වීමේදී හෝ විශ්‍රාමයාමේදී |

| | | | |
|---|---|---|---|
| | පාරිතෝෂික පනත | | ගෙවනු ලබන පාරිතෝෂික දීමනාව අවසන්වරට ගෙවනු ලැබූ දළ වැටුප මත පදනම්ව ගණනය කළ යුතු වුවත්, කොමිෂන් සභාව විසින් මූලික වැටුප පදනම් කරගෙන ගෙවා තිබීම හේතුවෙන් සේවයෙන් ඉවත් වූ නිලධාරීන් හතරදෙනෙකු සඳහා පාරිතෝෂික දීමනාව රු.118,012 ක් අඩුවෙන් ගෙවා තිබූණි. |
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| | මුදල් රෙගුලාසි 110 | | හානි හා පාඩු ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| **(ඇ)** | **භාණ්ඩාගාර චක්‍රලේඛ** | | |
| | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය | | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| **(ඈ)** | **රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය** | | |
| | (i) 2.4.1 මාර්ගෝපදේශය | 1,819,275 | ප්‍රසම්පාදන කාර්යයන් සඳහා විධිමත් ප්‍රසම්පාදන කමිටුවක් හා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර නොතිබුණි. |
| | (ii) 4.3 මාර්ගෝපදේශය | 1,406,025 | පරිගණක යන්ත්‍ර මිලදී ගැනීම සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණි. |
| | (iii) 8.9.1(ආ) මාර්ගෝපදේශය | - | වටිනාකම රු.500,000 ඉක්මවන භාණ්ඩ හා සේවා කොන්ත්‍රාත්තු සඳහා විධිමත් කොන්ත්‍රාත්තුවක් ලියා අත්සන් කර නොතිබුණි. |
| | (iv) 9.3 (ආ) මාර්ගෝපදේශය | 227,620 | වටිනාකම රු.200,000 වැඩි වාහන අළුත්වැඩියාවන් කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

(ඉ) 2004 ජනවාරි 24 දිනැති අංක 2004/ප්‍රස/1 දරන ජාතික පුස්තකාල ප්‍රලේඛන සේවා මණ්ඩලයේ උපදේශක චක්‍රලේඛය — පුස්තකාලයේ අස්ථානගත වී තිබූ පොත් 36 ක් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**13.7 අවිධිමත් ගනුදෙනු**

---------------------

නියැදි විගණන පරික්ෂණවලදි අනාවරණය වූ අවිධිමත් ස්වභාවයෙ ගනුදෙනු පිළිබඳ නිරික්ෂණ පහත දැක්වේ.

(අ) කොමිෂන් සභාවේ මහනුවර ශාඛාව සඳහා වර්ග අඩි 2,400 ක පමණ ප්‍රමාණයකින් යුත් නව ස්ථානයක් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලින් බැහැරව මාසිකව රු.35,000 ක කුලියට 2013 ජනවාරි 01 දින සිට ලබා ගෙන තිබුණි.

(ආ) 2003 දෙසැම්බර් 31 දිනැති අංක 113 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 8 ඡේදය ප්‍රකාරව මාසිකව වාහන කුලිය රු.40,000 ඉක්මවන අවස්ථාවලදී මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතු වුවත්, එයට පටහැනිව ප්‍රාදේශීය කාර්යාල 03 ක් සඳහා වාහන කුලී පදනම මත ලබාගෙන තිබුණි.

**13.8 මානව සම්පත් කළමනාකරණය.**

--------------------------------------

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

----------------------------------------------------------------

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 46 | 20 | 26 | - |
| (ii) | තෘතියික මට්ටම | 07 | 01 | 06 | - |
| (iii) | ද්විතියික මට්ටම | 154 | 101 | 53 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 66 | 53 | 13 | - |
| (v) | වෙනත් (අනියම්) | - | 03 | - | 03 |
| | **එකතුව** | **273** | **178** | **98** | **03** |

**(ආ) සියයට 25 ක දිමනා ගෙවීම**

**------------------------------**

2009 නොවැම්බර් 24 දිනැති අංක DMS/A/08/03/1-TEM දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලිපියට අනුකූල නොවන ලෙස ජොෂ්ඨ හා තෘතියික මට්ටම යටතේ කොන්ත්‍රාත් පදනම මත සේවය කරන නිලධාරීන් 05 දෙනෙකුට හා අනියම් පදනම මත සේවය කරන නිලධාරීන් 03 දෙනෙකුට සියයට 25 ක දීමනා වශයෙන් එකතුව රු.306,707 ක් සමාලෝචිත වර්ෂයේදි ගෙවා තිබුණි.